2022 JAN
02
LANKAYOUTH CHAT
LANKAYOUTH.COM
Youth en Vogue



# මට හොඳයි නම් මගේ හස්බන්ඩ්ට හොඳයි නම් අනිත් අයගේ කතා මට අදාළම නෑ



## මල්ෂා සෙව්වන්දි

**මල්ෂා... කාලෙකින්... කොහොමද ඉතින්.**

හොඳයි... හොඳින් සතුටින් කාලය ගත කරනවා. රටේ පවතින තත්ත්වයත් එක්ක සෞඛ්‍ය ආරක්ෂිතව මගේ වැඩකටයුතු කරගෙන යනවා.

**රංගන ක්ෂේත්‍රයේ වැඩිය පේන්න හිටියේ නෑ. රඟපෑමෙන් ඉවත් වෙලාද?**

නැහැ. ඇත්තටම රංගනයෙන් ඉවත් වෙලා නෙවෙයි.

**රංගනයේ යම් ස්ථාවරයක් සැකසෙමින් තිබියදී ඇයි එකවරම රංගනයට සමුදුන්නේ.**

රංගනයෙන් ඉවත්වෙලා නැහැ... පොඩි විවේකයක් ගත්තා. ඇත්තටම සැලෝන් එකේ වැඩයි බබා චූටි නිසා ටිකක් විතර රංගනයෙන් ඈත්වෙලා හිටියා. ඉතින් වසර හතරකට ආසන්න කාලයක් මම ක්ෂේත්‍රයෙන් දුරස්වෙලා හිටියා.

**ඉතින් ආයේ රංගනයට අදහසක් නැත්ද?**

මේ දවස්වල ආයෙත් රංගන අවස්ථාවන් කිහිපයකට මට ආරාධනා ලැබිලා තියෙනවා. ඒ වගේම ඉදිරියේදී රංගනයේ නිරත වෙන්න බලාපොරොත්තුවෙන් පසුවෙනවා. මොකද මේ වෙද්දි බබාට අවුරුදු දෙක හමාරක් වෙනවා.



ඡායාරූප : දුෂාන් නාමල්ආරච්චි/ මහීෂ චතුරංග

**ඉතින් පසුගිය කාලයේ ගෙදරට වෙලා ඉන්න අතරතුර මොනවද කළේ.**

කොවිඩ් වසංගත තත්ත්වයත් එක්ක ඉතින් වැඩි වශයෙන් කාලය ගත කළේ නිවසේමයි. ඉතින් පවුලේ සාමාජිකයන් සමග එදිනෙදා කාලය ගත කරන අතරේ සම පැහැපත් කරන ක්‍රීම් එකකුත් කළා.

**අලුත් නිෂ්පාදනයක් කළා කියලාත් ආරංචියි. මොකක්ද ඒ.**

සැලොන් එකේ වැඩත් එක්ක සම පැහැපත් කරන ක්‍රීම් එකක් අලෙවි කරනවා.

**කියමුද එකෙන් ලැබෙන ප්‍රයෝජන සහ එය මිලදී ගන්න පුළුවන් කොහොමද කියලා.**

ඇත්තටම පිම්පල්, පිග්මටේශන්, ලප කැලැල්වලට මේ ක්‍රීම් එක ගොඩාක් හොඳයි.

**සැලෝන් එකේ තත්ත්වය ගැනත් කියමුද?**

වරදක් නෑ හොදින් කරගෙන යනවා

**කොවිඩ් නිසා සැලෝන් එකට එල්ල වූ බාධා ගැනත් කියන්න.**

කොවිඩ් එක්ක ටිකක් ව්‍යාපාර කටයුතු අඩපණ වුණා. ඒත් දැන් නැවතත් රට යථා තත්ත්වයට පැමිණ තිබෙන නිසා කොහොම හරි උත්සායෙන් සාර්ථකව කරගෙන යන්න තමයි අපේක්ෂාව.

**ඒත් එක්කම මල්ෂා කියන්නේ කවුද කියලත් කියමු.**

මම මල්ෂා සෙව්වන්දි. මගේ ගම ගාල්ල. මම විවාහකයි. පාසල් ගියේ ගාල්ල ඕල්කට් මහා විද්‍යාලයට. සැමියා සහ දරුවන් සමග ඉතින් කාලය ගත කරනවා.

**ඔයාගේ රංගන දිවිය ගැන ටිකක් කියමුද?**

රංගනය කියන්නේ මං පොඩි කාලේ ඉඳන්ම මගේ හිතේ තිබුණු හීනයක්. මට වඩා මගේ තාත්තාගේ හීනයක්. තාත්තා මේ වෙද්දි ජීවතුන් අතර නැහැ.

ඉතින් මම රංගනයට එන්නේ මුලින්ම වයස අවුරුදු 15දී, ඒ කියන්නේ මම පාසල් යන අවදියේදී. රම්‍ය සුරම්‍ය කියන ටෙලි නාට්‍යයේ තමයි මුලින්ම රංගනයෙන් දායක වුණේ. රම්‍ය සුරම්‍ය, සඳපිණී වැස්ස, චූට්ටේ, රාජයෝගය, සල්සපුනා, ආටකනාටක, මං නැතිදා, 33 කාමරේ යන ටෙලි නාට්‍යවලටත් චිත්‍රපට තුනකට මං රංගනයෙන් දායක වෙලා තියෙනවා.

ඒ වගේම කියන්න ඕනි... මං රංගනයෙන් ඉදිරියට යනවට අකමැති පිරිසක් ඉන්නවා. ඒ අතර මගේ ළඟම ඥාතීනුත් ඉන්නවා. මම, මට හොඳයි නම් මගේ මහත්තයාට හොඳයි නම් අනිත් අයගේ කතා මට වැඩක් නෑ.

**ක්ෂේත්‍රයේ අයුතු යෝජනා එහෙම ඇවිත් තියෙනවද?**

දැනටනම් එහෙම අයුතු යෝජනා ඇවිත් නැහැ. රංගන ක්ෂේත්‍රයේ විතරක් නෙමෙයි ඕනෑම ආයතනයක ඕනෑම ක්ෂේත්‍රයක් තුල අයුතු යෝජනා එන්න පුලුවන්. තමන් නිවැරදිව තමන්ගේ ගමන යනවා නම්, තමන්ගේ ආත්මගරුත්වය තියන් ඉදිරියට යන්න පුළුවන්. අනෙක් දෙය තමයි රංගන ක්ෂේත්‍රයට එන්න බැරි අය තමයි ගොඩක් රංගනයට අපහාස කරන්නේ.

**මොනවද ඉදිරි බලාපොරොත්තු.**

ඉදිරියේදී රංගනයෙන් යළි ක්ෂේත්‍රයේ වැඩකටයුතු කරන්න තමයි බලාපොරොත්තුව.



✍ අනුර ප්‍රේමකුමාර

පිටුසැකසුම
Lankayouth.com